# අම්මා

G.G.නෙත්මි  කවීෂා දිව්‍යාංජලී අබේරත්න

# අම්මා


**G.G.නෙත්මි  කවීෂා දිව්‍යාංජලී අබේරත්න**

**කතෘ**

**පාසල- මා/බුද්ධඝෝෂ ජාතික පාසල- පලාපත්වල- මාතලේ**

**ශ්‍රේණිය - 11**



**කෘතිය පළකරන දිනය - 2025-02-08**

## විදුහල්පතිගේ ප්‍රකාශය

වත්මන් ගෝලීයකරණය වන ලෝකයේ දරු දැරියන් කියවීමෙන් දුරස්ව සිටින ස්වරූපයක් දක්නට ලැබෙන අවස්ථාවක මහනුවර මහාමායා විද්‍යාලය මඟින් පවත්වනු ලබන හෙරණගත්කරණි වැඩසටහන පැසසුමට ලක්කරමි.

දුවාදරුවන්ගේ නැණස වර්ධනයකරන මෙවැනි වැඩසටහන් ඉදිරියටත් සිදු කිරීමට අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

එමෙන්ම මා/බුද්ධඝෝෂ ජාතික පාසල නියෝජනය කරමින් වැඩසටහනට සහභාගි වන දරු දැරියන්ට සුභාසිංශන එක් කරමි.

A.J.අතුල සහම්පත්

විදුහල්පති

මා/බුද්ධඝෝෂ ජාතික පාසල

## නියෝජ්‍ය විදුහල්පතිනියගේ ප්‍රකාශය

හෙරණගත්කරණි වැඩසටහන මහතලා පුරවරයන් දිරිපත් වන දුවා දරුවන්ට සුභාශිංෂණය පිරිනමන අතර නූතන සමාජය තුළ සාහිත්‍ය රස වනිදනය කිරීම මිනිස් සමාජය තුළින් ක්‍රමයෙන් ඈත් වෙමින් පවතින කාල සීමාවක මහමායාවේ දියණිවරුන් විසින් සිදු කරන හෙරණගත්කරණේ වැඩසටහන තුළින් අප රටේ ශ්‍රේෂ්ඨ ගත්කරුවන් බිහිවේවායි ප්‍රාර්තනාකරමි.

R.M.S.P.K.රත්නායක

නියෝජ්‍ය විදුහල්පති

# <u>පිදුම</u>

කුස පිළිසිඳගත් දා සිට අද වනතුරු මා හදාවඩා ගත් ආදරණීය මෑණියන්ට හා පියාණන්ට මෙන්ම කුඩා කල පටන් අකුරු ලියන්නට ගුරුහරුකම් ලබාදුන් ගුරුමෑණිවරුන්ට ද පියවරුන්ටද ගුරුහරුකම් ලබන්නට පැමිණි පාසලේ

විදුහල්පති- A.J.අතුල සහම්පත් විදුහල්පතිතුමාට

පුස්තකාලාධිපති මෑණියන්ට ආදරයෙන් පිදුම් දෙමි

# පෙරවදන

ආදරණීය කුරුළු රංචුවක් සේ  වාසය කරන පවුලක් පිළිබඳ කතා පුවතකි. නමුත් අකාලයේ පවුලේ මුදුන්මුල වන පියා  මියයයි. මව හා පුතු දෙදෙනා පමණක්  තනි වේ.

සියළුම බර  කරට ගත් මව මතා  එකම පුතාට හොඳින් උගන්වයි.  සියළුම දේ වලින් හොඳින්පෝෂණයකරයි. පුතා හොඳින්  ගුරුහරුකම් ලබා ගෙන හොඳ තැනකට එයි.  නමුත් ඔහුට තම මව අමතක වෙයි. ඔහු තම මව රැකබලා ගත්තේ නැත. ඔහු විවාහ දිවියට එළඹෙයි. නමුත් තම මව දැක බලා ගැනීමටවත් ඔහු පැමිනෙන්නේ නැත. අවසානයේ මව මෙලොව  අතහැර  යයි. පුතු අවසානයේ කලකිරීමෙන් කල් ගෙවයි

නෙත්මි කවීෂා

# අම්මා

කසුන් කියන්නේ අහිංසක පෙනුමක් තියෙන අවිරුදු 10ක පුංචි පිරිමි ළමයෙක්. කසුන් ජීවත් වූයේ අම්මයි තාත්තයි එක්ක. තාත්තා වැඩ කරන්නේ කන්තෝරුවේ. කසුන්ගේ අම්මා කෑම හදලා කඩවල් වලට දානවා. මෙයාලා මේ ලැබෙන මුදලින් හරි ලස්සනට ජීවත් වුණා.

"පුතා ඉක්මනට නැගිටින්න හොදටම පරක්කු වෙලා තියෙන්නේ තාත්තට ඔයාව ඉස්කොලෙට ඇරලවලා කෑම ටික කඩවල් වලට දාලා වැඩට යන්නත් තියෙනවානේ...."

ඒ ඇසුනේ කසුන්ගේ අම්මාගේ හඩයි.

කසුන්ව උදේට නැගිට්ටවගන්න එක නම් අම්මට පොඩ්ඩක් අමාරු වැඩක්.

"වාසනා පුතාව ඉක්මනට ලෑස්ති කරලා එවන්න."

කෑම ටික මල්ලට දාලා නේද තියෙන්නේ?

"ඔව් ඔව්"

කසුන් ලෑස්ති වෙලා කෑම කාලා සාලෙට ආවා

අම්මටයි තාත්තටයි වැදලා ඉස්කොලෙට යන්න ලෑස්ති වුනා.

කසුන්ගේ අම්මයි තාත්තයි හරි ආදරෙන් කසුන්ව ඉසබා.

"වාසනා අපි එහෙනම් ගිහින් එන්නම් පරිස්සමෙන් ඉන්න බුදු සරණයි"

"හොදයි සරත් බුදු සරණයි"

"අම්මේ මං යනවා..... බායි"

"බායි පුතේ"

දෙන්නම බයිසිකලෙන් ඉස්කෝලෙට ගියා.

තාත්තා කසුන්ව ඉස්කෝලෙට දාලා කෑම ටිකත් කඩවල් වලට දැම්මා.

තාත්තා කන්තෝරුවට යන්න පිටත් වුණා. අවාසනාවකට වගේ බයිසිකලය වේගයෙන් ආපු ලොරියක හැප්පුණා.

කසුන්ගේ තාත්තා සදහටම කසුන්වයි කසුන්ගේ අම්මවයි මේ ලෝකේ තනි කරලා නොයෙන්නම යන්න ගියා.

පොලීසිය තමා වාසනාටත් කෝල් කරල විස්තර කියල තියෙන්නේ.

"හෙලෝ මේ සරත් මහත්තයගෙ ගෙදරද?"

"ඔව්.... ඇයි? කවුද මේ"

"මේ එයාගේ කව්ද?"

"මං එයාගේ Wife"

"මේ මිස් සරත් අද උදේ අනතුරකට පත් වෙලා එතනදිම නැති වෙලා තියෙනවා. මිස් පුළුවන් ඉක්මනට පොලීසියට එනවද? අපි මිනිය මල්ශාලාවට භාරදුන්නා"

"අනේ අනේ දෙයියනේ මගේ මහත්තයා අනේ දෙයියනේ මොන අපරාධයක්ද මේ"

මලගෙදර වැඩ ඉවර වුණා.

කාලය ටිකෙන් ටික ගෙවිලා ගිහින් දන්නෙම නැතිව අවුරුදු හයකුත් ගත වෙලා.

දැන් කසුන්ට වයස අවිරුදු 16යි. කසුන්ගේ අම්මා කෑම විකුණලා තමා කසුන්ගේ අධ්‍යාපන වලටයි ගෙදර වැඩ වලටයි වියදම් කරන්නේ.

කසුන් සාමාන්‍යපෙළ විභාගයට මුහුණ දෙන්නයි ඉන්නේ.

අම්මේ ඉක්මනට බත් එක ගෙනත් දෙන්න බස් එක මිස් උනොත් ඉස්කොලෙට යන්නත් නෑ.

හරි මෙන්න පුතේ.

අම්මා බත් මුලකුයි වතුර බෝතලයකුයි රුපියල් 100ක් කසුන් අතට දුන්නා.

අම්මා මං ගිහින් එන්නම්

කසුන් අම්මට වැදලා ඉස්කෝලේ ගියා

හොදයි මයේ පුතේ උබට බුදු සරණයි

කාලය නොදැනුවත්වම ගෙවිලා ගියා.

සාමාන්‍යපෙළ විභාගයේ පළමු දවස උදා වුණා

අම්මා හිරුටත් කලියෙන් අවදි වෙලා කිරිබත් හැදුවා කඩවල් වලට දාන්න කෑමත් හැදුවා.

කසුන් අම්මට වැන්දා තාත්තගේ මාලය දමා තිබූ ෆොටෝ එකටත් වැන්දා. දෙන්නම බුදුන් වැන්දා. අම්මා කිරිබත් කැටයක් කසුන්ට කැව්වා

අම්මා කඩවල් වලට දාන්න තියෙන කෑමත් අරගෙන කසුන් එක්ක ඉස්කෝලෙට යන්න පිටත් වුණා.

අම්මේ මං එහෙනම් යනවා.

හරි මගේ පුතේ බුදු සරණයි දළදා හාමුදුරුවන්ගේ පිහිටයි පරිස්සමින් පුතේ.

කසුන් පාසලේ ප්‍රධාන ගේට්ටුවෙන පාසලට ඇතුළු වුනා.

අම්මා කසුන් නොපෙනී යනකන් බලා හිඳ කෑම ටික කඩවල් වලට දාන්න පිටත් වුනා.

සාමාන්‍යපෙල විභාගය අවසන් වුනා. කාලය ගෙවිලා ගියා. සාමාන්‍යපෙළ ප්‍රතිඵල ආවා. අම්මයි කසුන්යි ප්‍රතිඵලය අහගන්නකල් ඉවසිල්ලක් නැතුව බලා ඉන්නවා.

ටික වේලාවකින් ඉස්කෝලේ ලොකු සර් කතා කරලා ප්‍රතිඵලය කිව්වා. කසුන් සාමාන්‍යපෙළ විභාගයෙන් දිස්ත්‍රික් ප්‍රථමයා වෙලා. කසුන්ටයි කසුන්ගේ අම්මටයි ඉහේ මලක් පිපුණා සේ සතුටක් ලැබුණා.

අනේ මගේ පුතේ තාත්තත් හිටියා නම් අද කොච්චර සතුටු වෙනවද මගේ පුතේ. උඹට බුදු සරණයි. පුතේ උඹ ලොකු මහත්තයෙක් වෙයන් පුතේ. තාත්තා කොහේ හරි ඉදලා අපි දෙන්නා දිහා බලන් ඉන්නවා ඇති පුතේ.

ඔව් අම්මේ අද තාත්තා හිටියා නම්

කසුන්ට වෙන ටවුමේ ලොකු ඉස්කොලෙකට යන්න පුලුවන් උනා.

ඔහොම දින සති මාස ගෙවිලා ගියා.

කසුන් ඊලගට තමන්ගේ ජිවිතයේ මූන දෙන්න තියෙන ලොකුම කඩයිම උසස්පෙල විභාගයට ගොඩක් මහන්සි වෙලා උනන්දුවෙන් වැඩ කරනවා.

අමමිත් ගොඩක් මහන්සි වෙලා සල්ලි හොයනවා.

ඒ දැන් කසුන්ගේ අධ්‍යාපන වැඩ වලටත් ලොකු වියදමක් යන නිසා.

කසුන්ගේ යාළුවෝ ටියුෂන් වලට ගිහින් හොදට ඉගෙන ගන්නවා. මටත් යන්න ඕනි කියලා කසුන් අම්මට කියනවා.

හරි පුතේ පුතා යන්න සල්ලි නේන තියෙන දවසට කියන්න

කසුන්ට හොද ටියුෂන් ගුරුවරයෙක් හම්බ වෙනවා සර් ගොඩක් හොදට කසුන්ට උගන්වනවා. කසුනුත් හොදට අහගෙන ඉන්නවා. කසුන් ටියුෂන් සර්ව අම්මටත් හදුන්වලා දෙනවා.

අනේ මහත්තයෝ මගේ පුතාව ගොඩදාලා දෙන්න.

හරි අම්මේ කසුනුත් වැඩ ටික හොදට කරනවා. මෙහෙම ගියොත් එයාට විභාගෙ ගොඩ දාගන්න එක ලේසි දෙයක්. පුතා කොහොමත් දක්ෂයි.

කාලයක් යනකොට කසුන්ගේ අම්මා ලෙඩ වෙනවා. එත් එයා ඒක හංගගෙන ගොඩක් මහන්සි වෙලා වැඩ කරනවා.

කාලයක් යනකොට කඩවල් වලින් කසුන්ගේ අම්මගේ කෑම ගන්න කවුරුත් කැමති වෙන්නේ නෑ.

ඒත් මේක ගැන අම්මා කසුන්ට කියන්න යන්නේ නෑ.

අම්මා තීරණය කරනවා කසුන් යන ඉස්කෝලෙ ලඟ කෑම විකුණන්න. ඒ කසුන්නට ලැජ්ජා කරන්න හිතාගෙන නම් නෙවෙයි. ඒ හරියේ ගොඩක් මිනිස්සඅ ගැවසෙන නිසයි.

මේක කසුන්ට ආරන්චි වෙනවා. ඒ එයාගේ යාළුවෙක්ගේ මාර්ගයෙන්.

අඩෝ කසුනා උබේ අම්මා නේද බං අර ඉස්කෝලේ ඉස්සරහ කෑම විකුණන්නේ. අප්පෝ බං උබට ලැජ්ජා නැද්ද බං.

මොකක්

අම්මේ අම්මේ

ඇයි මගේ පුතේ

මොකක්ද අම්මේ මේ ශානුක කියන්නේ

අම්මා ඉස්කෝලේ ඉස්සරහ කෑම විකුණණවද?

අම්මට පිස්සුද මට ලැජ්ජ කරන්නද හදන්නේ. අනේ අනේ ඔව් පුතේ මගේ මේ කරුමක්කාර ලෙඩේ නිසා කඩවල් වලින් මගේ කෑම ගන්නේ නෑ පුතේ ඒකයි මම ඉස්කෝලෙ ලගට ආවේ

අම්මට පිස්සුද දැන් නම් වදයක් මට ඔයා

එහෙම කියන්න එපා පුතේ

කසුන්ගේ අම්මට කෑප විකුණන්න වෙන තැනක් හම්බවුනේ නෑ කෑම විකුණුවේ නැත්නම් ඉන්න වෙන්නේ බඩගින්නේ. කසුන්ගේ ටියුෂන් වලට ක්ලාස් ෆීස් ගෙවන්න වෙන්නෙත් නෑ. ඒ නිසා අම්මා ඉස්කොලේ ලගට ගිහින් කෑම විකුණන එක නතර කළේ නෑ.

පුතේ නැගිටිනන්කෝ ඉස්කෝලේ යන්න තියෙනවා

කසුන් ඉස්කෝලේ යන්න ලැස්ති වුනා කසුන්ගේ අම්මා කෑම එකයි වතුර බෝතලෙයි රුපියල් 100යි කසුන්ගේ අතට දුන්නා

අම්මේ මට කෑම එපා මං යන්නම්

කසුන් අද අම්මට වැදලා ගියේ නෑ

අම්මා වෙනදා වගේම ඉස්කෝලේ ලගට ගියා

කසුන්ගේ අම්මා කෑම විකුණලා 1.30 වෙන්න කලින් එතනින් යනවා එත් අද කසුන්ගේ අම්මට ඒ වෙලාවට යන්න බැරිවුනා ඒ කෑමතවත් ඉතුරු වෙලා තිබුණ නිසා

කසුන් යාළුවෝඑක්ක ගේට්ටුවෙන් එළියට ආවා

කසුන් දැක්කා අම්මා ඉන්නවා කසුන්ගේ යාළුවෝ එකිනෙකා හිනා වෙවී මූණුවල් දිහා බලාගත්තා.

කසුනා ඒ උඹේ අම්මා නේද? අයියෝ විලි ලැජ්ජාවේ බෑබං අපිටත් එක්ක අපි යනවා බං බායි උඹ අම්මා එක්ක කෑම විකුණාහං.

කසුන්ගේ යාළුවෝ නෝන්ඩියට වගේ හිනා වෙලා එතනින් යන්න ගියා.

අනේ අම්මේ මේ මං කිව්වනේ  මෙතනට එන්න එපා කියලා. ඔයාට කියන දේ අහන්න බැරිද

විලිලැජ්ජාවේ බෑ අම්මේ අරුන් මට හිනාවෙලා ගියා අම්මට ඇහෙන්න ඇති නේද?

අනේ පුතේ මං මොනවා කරන්නද දෙයියනේ

අනේ නෙවේ භානුක කිව්වා මට උන්ගේ දිහා එන්න කියලා මං යනවා එහේ

යන්න එපා රත්තරනේ

අනේ ඔහොම ඉන්න ළමයෝ

කසුන් තමන්ගේ රෙදියි පොතුයි බෑග් එකට දාගෙන තමන්ගේ යාළුවෙක් උන භානුකලා දිහා යන්න ගියා.

අම්මා කසුන්ගේ ටියුෂන් සර්ට කථා කරලා උන හැමදේම අඬ අඬා කිව්වා

සර් අනේ සර් මං මේ දේවල් සර්ට කිව්වා කියල වත් කසුන්ට කියන්න යන්න එපා සර් මේ මොකුත් දන්නෑ වගේ ඉන්න.

සර් මගේ පුතාට හොඳින් උගන්වන්න මං සර්ට ෆීස් ගෙවන්නම් එත් මං සල්ලි දෙනවා කියලා කසුන්ට කියන්න එපා සර්

හොඳයි අම්මේ මම කියන්න යන්නෑ

කාලය ගෙවිලා ගියා විභාග දිනය උදා වුනා

අම්මා උදේම නැගිටලා බුදුන් වැන්දා

වෙනදා වගේම ඉස්කෝලේ ලගට ගියා

කසුණුයි භානුකයි උදේම නැගිටලා බුදුන් වැන්දා භානුකගේ අම්මා දෙන්නටම කිරිබත් කැව්වා දෙන්නම භානුකගේ අම්මටයි අම්මටයි තාත්තටයි වැන්දා භානුකගේ අම්මයි තාත්තයි හරි ආදරෙන් භානඅකව වැළඳගත්තා

එවෙලේ කසුන්ට එයාගේ අම්මයි තාත්තයි මතක් උනා

ටියුෂන් සරුත් උදේම කතා කරලා දෙන්නම විභාගයට ජය පැතුවා. කසුන්ගේ අම්මා තමා උදේම සර්ට කතා කරලා දෙන්නටම හොදට විභාගය ලියන්න කියලා කියලා තියෙන්නේ මේ විස්තර සර් කසුන්ට කියන්න ගියේ නෑ. විභාගය දවස් අවසන් වුණා. කසුන්ගේ අම්මගේ අසනීප තත්වය එන්න එන්න වැඩි වෙනවා. ඒත් කසුන් අම්මව හම්බවෙන්න ගියේ නෑ. විභාග ප්‍රතිඵල නිකුත් වුණා කසුන් වගේම කසුන්ගේ අම්මත් විභාග ප්‍රතිඵල දැනගන්නකන් නොයිවසිල්ලෙන් බලාන ඉන්නවා. ටියුෂන් සර් ඉස්සෙල්ලාම අම්මට කතා කරනවා.

අම්මේ කසුන් දිස්ත්‍රික් ප්‍රථමයා එයා ගොඩ ගියා අම්මේ

අනේ මගේ පුතාට බුදු සරණයි සර්ටත් ගොඩාක් පින් සර් මගේ කොල්ලව ගොඩ දැම්මට

මට නෙවෙ පිං අම්මේ. අම්මට

කසුන්ට පහුවෙලා හරි අම්මා ගැන තේරෙයි

සර් කසුන්ට කෝල් කරලා ප්‍රතිඵලය කිව්වා

අනේ සර් මට විශ්වාස කරන්නත් බෑ සර්ට ගොඩක් පින්

මං දැනන් හිටියේ පුතේ උඹ කොහොමත් ගොඩ යනවා කියලා.

කසුන්ට සරසවි වරම් ලැබුණා

කසුන්ට ඇවිත් තියෙන්නේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය

කසුන්ට හැමදාම භානුකලගේ ගෙදර ඉන්න බැරි නිසා පේරාදෙණිය විශ්වවිද්‍යාලය ලග බෝඩිමක නතර වෙනවා මෙයා මේක ටියුෂන් සර්ට විතරක් කියනවා

කසුන් බෝඩිමට ගියා එයා එදාම පාට් ටයිම් ජොබ් එකකුත් හොයා ගන්නවා

සරුත් ඉදලා හිටලා කසුන්ට සල්ලි යවනවා

ටියුෂන් සර් මේක අම්මව කියන්නේ ටික දවසක් ගියාට පස්සේ

මොකක් අනේ සර් මගේ දරුවා කොහේ ඉන්නවද දන්නෑ සල්ලි තියෙනවද දන්නෑ

සර් සර්ට පුළුවන් නම් මේ ෆෝන් එකෙන් පුතාට කෝල් එකක් අරන් දෙනවද?

හරි අම්මේ මෙන්න

කසුන් කෝල් එක ආන්ස්වර් කරනවා

හෙ හෙලෝ රත්තරනේ

කවුද මේ

පුතේ මං ඔයාගේ අම්මා

කසුන් කෝල් එක කට් කරා

පුතේ හෙලෝ ඇහෙන්නේ නැද්ද පුතේ ඔයා කෑවද මාව බලන්න එන්නේ නැද්ද හෙලෝ පුතේ

ඇයි අම්මේ ඇහෙන්නේ නැද්ද කෝ දෙන්න මං බලන්න ආ මේ මේ කසුන් කෝල් එක කට් කරලා

එහෙමද කමක්නෑ සර් පුතා වැඩක වෙන්න ඇති පස්සේ ගනීවි එයා ඔහොම හිටියට මට ආදරෙයි සර්

ඔව් නේද අම්මේ

කසුන්ට විශ්වවිද්‍යාලයෙන්ම සහකාරියක් හම්බඋනා

එයාලා එයාලා දෙන්නගේ ලෝකෙ සතුටින් ඉන්නවා

කසුන් දොස්තර මහත්තයෙක් වෙනවා

එයාගේ සහකාරිණිය හෙදියක් මේ දෙන්නා විවහා වෙනවා එයාලා දැන් පුංචි කැදැල්ලක්

කසුන්ගේ අම්මට හොදටම වයසයි

හදිසියේම අම්මට අසනීප වෙනවා ගමේ මිනිස්සුයි සර්රුයි විතරයි අම්මා ලග ඉන්නේ සරුත් දැන් වයසයි.

කසුන්ගේ අම්මා ඉස්පිරිතාලේ ඉද්දි සර්ට කියනවා පුතාට කෝල් එකක් අරගෙන දෙන්න කියලා

සර් මම අවසන් වතාවට ඉල්ලන්නේ සර්ට පුළුවන්ද මට මගේ පුතාට කොල් එකක් අරගෙන දෙන්න

එහෙම කියන්න එපා අම්මේ ඉන්න මම ගන්නම්

ඔබ ඇමතූ අංකය ක්‍රියා විරහිත වී ඇත

අම්මේ කසුන්ගේ ෆෝන එක වැඩ නෑ පස්සේ ගයි

ඔව් නේද සර්

සර් ගෙදර ඉන්න වෙලාවක පුතා ගත්තොත් පුතාට මං ගොඩක් ආදරෙයි කිව්වා කියන්න මං එයා එක්ක තරහ නෑ කියන්න මගේ පුතාට බුදු සරණයි කිව්ව කියන්න සර් ගෙදරයි ඉඩමයි එයාගේ නමට ලිව්වා කියන්න  සර් සර්ටත් බුදු සරණයි මෙච්චර කාලයක් මට උදව් කරාට සර්ට ගොඩක් පින්

මෙහෙම කියලා පැයක් යන්න කලින් කසුන්ව පොඩි කාලේ ඉදලා බලා ගත්ත කන්න බොන්න දීලා එයාට උගන්වපු ඒ අම්මා මේ ලෝකෙන් සදහටම යන්න ගියා.

සර් කසුන්ට කොච්චර කෝල් ගත්තත් කසුන් ආන්ස්වර් කරේ නෑ ඒ තරමටම කසුන් බිසී උනා

සර්රුයි ගමේ අයයි එකතු වෙලා මළගෙදර වැඩකටයුතු හරියාකාරව සිද්ද කළා ගමේ අවමංගල්‍යාධාර සමිතියෙන් වියදම් දැරුවා

කසුන් සතියකට පස්සේ සර්ගේ කොල් දැක්කේ

කසුන් ඒ විගසම සර්ට කෝල් එකක් ගන්නවා

හෙලෝ සර් කොහොමද

හොඳින් ඉන්නවද

හෙලෝ දැන්ද පුතේ උබට මගේ කෝල් ආවේ

අනේ සමාවෙන්න සර් මම මේ දවස් ටිකේ ගොඩක් බිසි උනා.

සමාව ඉල්ලන්න ඕනි මගෙන් නෙවෙයි උබේ අම්මාගෙන් පුතේ

ඇයි සර් මොකද උනේ අම්මට

ඔයා දැන්ම ගමේ එන්න

හරි සර් මං එන්නම්

කසුන් අවුරුදු අටකට විතර පස්සේ එයාගේ Wife එක්ක උපන් ගමට ආවා කසුන් ඉස්සරවෙලාම ගෙදර ගියා

අම්මේ අම්මේ මං ආවා දොර අරින්නකො මට සමාවෙන්න අම්මේ

එතකොට එතෙන්ට සර් ආවා ගේ ඉස්සරහ කාර් එකක් නතර කරල තියෙන නිසා

අහල පහල මිනිස්සුත් ආවා

ආ මට අඳුරගන්න බැරි උනානේ මෙ කසුන් පුතානේ මේ පුතාගේ

ඔව් සර් මේ මං බැදපු කෙනා

අනේ අනේ හරි ශෝක් අම්මගේ මළගෙදරට වත් ආපු නැති පුතා දැන් ඇවිත්

ගමේ කෙනෙක් එහෙම කිව්වා කසුන්ට ඇහුනා

තමකක් මොනවද ඔයාලා මේ කියවන්නේ

හ්ම් ඔව් කසුන් ඔයාගේ අම්මා දැන් මේ ලොකේ නෑ එයා අපිව දාලා ගියා

අනේ මගේ අම්මේ අනේ මට සිය දහස් වාරයක් සමා වෙන්න අම්මේ

අනේ අම්මේ

උබ කොච්චර ලොකු තැනකට ගියත් වැඩක් නෑ

උඹ උඹේ අම්මට කියපු ඒවා උඹ උඹේ අම්මගේ හිත කොච්චර රිද්දෙව්වද?

ගමේ මිනිසකු කසුන්ට හොදටම ශාප කරනවා

කසුන් පුතේ උඹ කරපු වැඩේ නම් වැරදි උඹ දන්නවද අම්මා අවසානෙට කිව්වේ උඹට හරි ආදරෙයි උඹට බුදු සරණයි කියලා මේ ගෙදරයි ඉඩමයි අම්මා උඹේ නමට ලියලා තියෙන්නේ කිව්වා

ඒ වගේම උඹ දන්නවද උඹට උගවන්වන්න අම්මා මට සල්ලි දුන්නා උඹේ ප්‍රතිඵල ආපු වෙලාවෙ අම්මා තමා ගොඩක් සතුටු උනේ

අම්මා උඹට හුගක් ආදරෙයි කසුන් එත් උඹ දැන් පරක්කු වැඩි

අනේ සර් මගේ අම්මා

මට සමාවෙන්න මගේ අම්මේ මං අම්මව ගොඩක් රිද්දෙව්වා මං මහ තිරිසනෙක් අම්මේ

කසුන් කොච්චර ලොකු තැනකට ආවත් අවසානෙට එයාට එයා ගැනම අප්‍රසන්නයක් ඇති වුනා.

**උපදේශය**

දෙමාපියන් ජිවත් වෙලා ඉන්න කාලයේදි ඔවුන්ට සලකන්නේ නැතිව දෙමාපියන් මේ ලෝකෙන් ගිය දාට බොරුවට අඩල දොඩලා කිසිම ඵලක් නොමැත

# පසුවදන

